ක. යු. 2008.08.01 දින පළ කරන ලද අංක 1,561ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,562 - 2008 අගෝස්තු මස 08 වැනි සිකුරාදා - 2008.08.08**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 925 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 අගෝස්තු මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අගෝස්තු මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

### මිනින්දෝරු දෙපාර්තමේන්තුව

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගයට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *තනතුරේ ස්වභාවය :-* මැනුම් කටයුතු වලට අදාළ උපකරණ සහ මෙවලම් නඩත්තු කිරීම හා සේවා කිරීම.

03. 1. *පෙනී සිටිය යුතු ප්‍රශ්න පත්‍ර :*

(අ) ප්‍රශ්න පත්‍ර 1 - බුද්ධි පරීක්ෂණය

(ආ) ප්‍රශ්න පත්‍ර 2 - සාමාන්‍ය දැනීම (තනතුරට අදාළ තාක්ෂණික දැනුම සහිත ප්‍රශ්න ද ඇතුළත්වේ.)

2. ප්‍රශ්න පත්‍ර සඳහා සමාන ලකුණු හිමිවේ. මෙම ප්‍රශ්න පත්‍රවලට ලබාගන්නා මුලු ලකුණු සංඛ්‍යාව මත තේරීම කරනු ඇත.

04. *බඳවා ගැනීමේ ශ්‍රේණිය .-*මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුරේ 111 ශ්‍රේණිය

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර තෝරා ගනු ලබන නිලධාරීන් ප්‍රධාන කාර්යාලයේ සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය. මෙම ගැසට් නිවේදනය ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

06. *වැටුප් පරිමාණය :*

මැනුම් උපකරණ කාර්මික ශිල්පී III ශ්‍රේණිය:

මාසිකව 14,425-10 x 145-11 x 170 - 6 x 240-14 x 320-23,665 (එම්. ටී. 1 - 2006 - ඒ).

මැනුම් උපකරණ කාර්මික ශිල්පී II ශ්‍රේණිය:

මාසිකව 14,425-10 x 145-11 x 170 - 6 x 240-14 x 320-23,665 12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ. (එම්. ටී. 1 - 2006 ඒ).

මැනුම් උපකරණ කාර්මික ශිල්පී I ශ්‍රේණිය:

මාසිකව 14,425-10 x 145-11 x 170 - 6 x 240-14 x 320-23,665 23 වන වැටුප් පියවරෙන් ආරම්භවේ. (එම්. ටී. 1 - 2006 ඒ).

මැනුම් උපකරණ කාර්මික ශිල්පී තේරීම් ශ්‍රේණිය:

මාසිකව 20,030-11 x 365-18 x 500 -33,045 (එම්එන්.7 - 2006 - ඒ).

07. *වයස් සීමාව .-*අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයට උපරිම වයස් සීමාව බලනොපානු ඇත.)

08. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) 90%ක් වන බාහිර අයදුම්කරුවන් සඳහා –
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් පහක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල හෝ දෙමළ, විද්‍යාව, ගණිතය/අංක ගණිතය යන විෂයන්ගෙන් තුනකට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත්වීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සමත්ව තිබීම;

සහ

රජය පිළිගත් කාර්මික විද්‍යාලයකින් ඉලෙක්ට්‍රොනික් හෝ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව වූ එක් අවුරුදු පාඨමාලාවක් හදාරා තිබීම.

09. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය .-* පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා අදාළ චක්‍රලේඛ අනුව පත්කිරීම සඳහා තෝරාගනු ලැබේ.

10. සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යවේ.

11. *ඉල්ලුම්පත්‍ර හා අනෙකුත් විස්තර :*

(අ) (I) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙන්ටිමීටර් 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල තමන් ඉල්ලුම්පත්‍ර සකසාගත යුතු අතර ඉල්ලුම්පතේ 01 වන පිටුවේ අංක 01 සිට 09 දක්වා, 02 වන පිටුවේ අංක 10-12 දක්වා, 03 වන පිටුවේ අංක 13,14,15 ඡේදයන් ඇතුළත් විය යුතු අතර විභාග ගාස්තු ගෙවා ලබාගත් කුවිතාන්සිය ඊට පහළ කොටසේ ඇලවිය යුතුය.
ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර" යනුවෙන් සඳහන් කර 2008.09.10 දින හෝ ඊට පෙර මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(පෞද්ගලික නමට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය.)

(II)අසම්පූර්ණ නියමිත සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(III) තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත්‍ර ගැන වග කියනු නොලැබේ.

(IV)මොනම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවීමක් නොකෙරේ.

(V) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

*(ආ)* ඉල්ලුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චයකරුවෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ යුද්ධ හමුදාවේ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබිය යුතුය.

12. පහත සඳහන් ලියවිලි ද කැඳවීමක් කරනු ලබන අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.

I. උප්පැන්න සහතිකය,

II. අධ්‍යාපන සහතික,

III. මෑතකදී ලබාගත් ග්‍රාමසේවා නිලධාරි සහතිකයක්,

IV. චරිත සහතික දෙකක්.

*සැලකිය යුතුයි .-* ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ ඉල්ලුම්පත්‍රයට අමුණා නොඑවිය යුතුය.

13. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතුය.

14. විභාග ගාස්තුව රු. 200කි. ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතේ ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ අලවා තිබිය යුතුය. මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

15. විභාගය පවත්වනු ලබන මධ්‍යස්ථාන ප්‍රධාන කාර්යාලයේ හෝ වෙනත් සුදුසු මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන් වෙත පසුව දැනුම්දෙනු ලැබේ.

16. *විභාගයට ඇතුල්වීම .-* අයදුම්පත් එවා ඇති හා මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අපේක්ෂකයන්ට ඔවුන් අයදුම්පතේ සඳහන් කළ ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපෑලෙන් යැවෙනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන.-* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොපිළිගනු ඇත.

17. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය .-* විභාග ශාලාවේදී එහි විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරු සිය අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත :

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

*(ආ)* තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත;

*(ඇ)* වලංගු ගමන් බලපත්‍රය.

18. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් .-* අපේක්ෂකයකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ කිසියම් වැදගත් කරුණක් වසන් කර ඇති බව හෝ ඔහු/ඇය තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

19. *භාෂා මාධ්‍ය.* - මෙම විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලබන අතර අයදුම්කරුවන් කැමති මාධ්‍යයකින් ඒ සඳහා ඉදිරිපත් විය හැක. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු නොලැබේ.

20. මෙම කොන්දේසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මැනුම්පති විසින් තීරණය කෙරෙන පරිදි කටයුතු කෙරෙනු ඇත.

බී. ජේ. පී. මෙන්ඩිස්,
මැනුම්පති.

2008 ජූලි මස 22 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මැනුම් උපකරණ කාර්මික ශිල්පී තනතුර සඳහා තරග විභාගය*

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(දෙන ලද කොටු තුළ සංකේත අංකය යොදන්න)

01. (i) මුලකුරු සමඟ නම :

(i) සිංහලෙන් :—————.
(ii) ඉංග්‍රීසියෙන් :—————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්):

(i) සිංහලෙන් :—————.
(ii) ඉංග්‍රීසියෙන් :—————.

02 (i) ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්):—————.
(ii) ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය:—————.

03. ස්ත්‍රී පුරුෂ භාවය (පුරුෂ - M ස්ත්‍රී - F )

04. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:-
(සිංහල - S. දෙමළ - T. ඉංග්‍රීසි -E )

05. ජනවර්ගය :-
(සිංහල - 1, ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2, මුස්ලිම් -3, ඉන්දියානු ද්‍රවිඩ - 4, බර්ගර් - 5, මැලේ -6, වෙනත් -7)

06. (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————.
(ii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය:————————.
(iii) දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද ?:——————.

07. පුරවැසිභාවය:-

පරම්පරාවෙන් :- [ ]

ලියාපදිංචිවීමෙන්:- [ ]

08. ජාතික හැඳුනුම්පත් අංකය:——————.

09. (i) උපන් දිනය :
වර්ෂය:—————, මාසය:————, දිනය:—————.

(ii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස:
වර්ෂ :—————.මාස:—————. දින:—————.

10. අධ්‍යාපන සුදුසුකම්:-

(i) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)
*පළමුවර*
1. විභාගය වර්ෂය සහ මාසය:——————.
2. අයදුම්කරුගේ විභාග අංකය:——————.
3. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(ii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)
*දෙවන වර*
1. විභාගය වර්ෂය සහ මාසය:——————.
2. අයදුම්කරුගේ විභාග අංකය:——————.
3. සමත් වූ විෂයයන් :——————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

(iii) අ.පො.ස. (උසස්පෙළ)

1. විභාග වර්ෂය :——————.
2. අයදුම්කරුගේ විභාග අංකය:——————.
3. විභාග මධ්‍යස්ථානය:——————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. වෙනත් සුදුසුකම්:-

12. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

ඔව් [ ] නැත [ ]

ඔව් නම් විස්තර සඳහන් කරන්න.

12. මුදල් ගෙවන ලද මිනින්දෝරු කාර්යාලය:————————.
රිසිට්පත් අංකය:————————.
මුදල් ගෙවන ලද දිනය:————————.
(පිටු අංක 03 හි රිසිට්පත ඇලවිය යුතුය.)

13. *අයදුම්කරුගේ සහතිකය :-*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පුවුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) රු. 200ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ අලවා ඇත.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...............................නැමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය.................................. දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන ලද බවත් සහතික කරමි.

————————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය:————————.
සහතික කරන්නාගේ නම:————————.
තනතුර:————————.
ලිපිනය:————————.

(කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :-

තෝරාගනු ලැබුවහොත් මෙම නිලධාරියා මුදාහැරිය හැකිය./නොහැකිය.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————.

08-384

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

## අරේඛීය සංස්කරණ විෂය හැදෑරීම සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාව

## CERTIFICATE COURSE IN NON LINEAR EDITING

*(වීඩියෝ, රූපවාහිනී සහ චලන රූප කර්මාන්තය සඳහා සකස් වුණු පාඨමාලාවක්)*

1984 අංක 18 දරන පාර්ලිමේන්තු ආඥා පනත මගින් ලාභ නොලබන පදනම යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, අරේඛීය සංස්කරණ විෂය හැදෑරීම සඳහා සහතිකපත් පාඨමාලාවක් හඳුන්වා දී ඇත. වීඩියෝ, රූපවාහිනී සහ චලන රූප කර්මාන්තයෙහි ද, ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනය සහ චිත්‍රපටි කර්මාන්තයෙහි නිරතවූවන් හට මෙම විෂයය හැදෑරීමට මෙමගින් අවස්ථාව සැළසෙනු ඇත.

පාඨමාලා කාලසීමාව.- මාස 03 යි
උපදෙස් මාධ්‍යය.- සිංහල සහ ඉංග්‍රීසි
ඇතුල්වීමේ සුදුසුකම්.- Windows භාවිතය පිළිබඳ පළපුරුද්ද
පාඨමාලා ගාස්තු.- රු. 17,500
සහභාගීවන සංඛ්‍යාව.- 16 දෙනෙකු සීමා කර ඇත
ආරම්භක දිනය.- අගෝස්තු මස
දේශන.-සෙනසුරාදා ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා හෝ ප.ව. 5.00 සිට 8.00 දක්වා
කා සඳහාද.- පරිඝණක චිත්‍රක නිර්මාණකරුවන් (සංඛ්‍යාංක චිත්‍රපට සංස්කරණය පිළිබඳ ගැඹුරින් හැදෑරීමට අවශ්‍ය අය.)

සම්ප්‍රදායික චිත්‍රපටි හා රූපවාහිනී, සංස්කරණය පිළිබඳ හැදෑරීමට ද නූතන සංඛ්‍යාංක චිත්‍රපටි සංස්කරණය වෘත්තියක් වශයෙන් හැදෑරීමට අවශ්‍ය අයට සහ සංස්කරණ උපකරණ පිළිබඳ පූර්ණ අවබෝධය ලැබීමට අවශ්‍ය අය.

තම වෘත්තීය දියුණුව සඳහා කාර්මික/තාක්ෂණික දැනුම වර්ධනය කර ගැනීම සඳහා අපේක්ෂා කරන චිත්‍රපටි සහ රූපවාහිනී කර්මාන්තයේ නියැලී සිටින අය.

අන්තර් ජාල සේවා සපයන්නෝ සහ අන්තර් ජාලය මගින් සංඛ්‍යාංක චිත්‍රපටි පහසුකම් සපයන කාර්මිකයින් සඳහා.

වෘත්තියක් වශයෙන් අරේඛීය සංස්කරණ විෂයය උපයෝගී කර ගැනීමට අරමුණු කර සිටින පාසැල් හැර යන අය සඳහා.

පාඨමාලා අන්තර්ගතය

**Course Outline —**

**1. An Introduction to Non- Linear Editing**

1.1 Theory of Motion picture
1.2 Analog and Digital TVs
1.3 Analog to Digital Conversion and vise versa
1.4 Hardware and Software components for Non-Linear Editing
1.5 Non - Linear versus Linear Editing

**2. Power of Visual Communication**

2.1 What is editing
2.2 History of Editing
2.3 Story telling through editing
2.4 What is the difference between the Editing Machine Operator and the Editor
2.5 Theory of "Second Birth of a Creation"

**3. Script writing basics**

**4. The DV, DVCAM and DVCPRO Formats**

4.1 Format specifications and current equipment capabilities.
4.2 Format comparisons

4.2.1 DV and H 18
4.2.2 DV and Betacam SP
4.2.3 DV and VHS

**5. Movie codes**

5.1 Introduction to video codes
5.2 Compressed and uncompressed video
5.3 Motion JPEG and other codes
5.4 Selection of best codes for the delivery platform.

**6. Creating a rough cut**

6.1 Specifying project settings
6.2 Importing the clips
6.3 Triming clips
6.4 Adding audio
6.5 Adding Transition

**7. Special effects**

7.1 Changing the speed of a movie
7.2 Changing clip's opacity
7.3 Adding filters
7.4 Superimposing a still picture
7.5 Animation a clip.

**8. Capturing movie for on - line editing**

8.1 Off- line editing
8.2 On- line editing
8.3 Preparing for video capture

9. **CD Technology/DVD**

10. **Audio**

10.1 Fading and cross fading
10.2 Panning a clip
10.3 Applying audio filters
10.4 Digital sound processing

11. **Titles**

11.1 Importing a sample frame
11.2 Creating text objects

11.3 Creating graphic objects

12. **Producing final movie**

12.1 Setting up video codecs
12.2 Setting data rates
12.3 Exporting to different file types
12.4 Creating a video tape

13. **Creating movie files for the internet**

13.1 Animated GIF, FIF, Sequence and GIF
13.2 Quicktime
13.3 Directshow
13.4 MPEG and streaming video

සීමිත සිසුන් සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් පහත දුරකථන අංකයෙන් අමතා හෝ පහත ලිපිනයට පැමිණ ආසනයක් වෙන් කරවා ගන්න:

*විමසීම්* .- ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118,
දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

දුරකථන අංකය :- 2679791/2686162
ෆැක්ස් :- 2686162
ඊමේල් :- Sliopres@sltnet.lk

08-288

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය*

*මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත*

2009 වසර සඳහා ආධුනිකයින් බඳවා ගැනීම

ජපන් රජයේ ආධාර මත වැල්ලම්පිටිය ඔරුගොඩවත්තේ පිහිටුවා ඇති මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2009 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුහුණු කරනු ලබන වෘත්තීන් :

| | *වෘත්තිය* | *කාලය* |
|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පි<br>Automobile Mechanic | අවු. 03 |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පි<br>Automobile Electrician | අවු. 03 |
| 1.3 | යන්ත්‍ර ශිල්පි<br>Machinist | අවු. 03 |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පි<br>Automobile A/C Mechanic | අවු. 02 |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී<br>Automobile Tinker | අවු. 1 1/2 |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී<br>Automobile Painter | අවු 1 1/2 |

2. ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්:-

2.1 1.1 සිට 1.4 දක්වා වෘත්තීන් සඳහා

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ (මාධ්‍ය භාෂාව), ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. තව ද ගණිතය I, II සහ විද්‍යාව, I, II සමත් අයදුම්කරුවන් එය පැහැදිලිව වෙන් වෙන් වශයෙන් අයදුම්පතෙහි සඳහන් කළ යුතු වේ.

2.2 අංක 1.5 සිට 1.6 දක්වා වෘත්තීන් සඳහා

රජයේ ආධාර ලබන හෝ අනුමත කරන ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් විය යුතුවේ.

3. වයස:-

2009.01.01 වන දිනට වයස අවුරුදු 16ට නොඅඩු 25ට නොවැඩි විය යුතුයි.

4. පුහුණුව පිළිබඳ විස්තර:-

4.1 වෘත්තීය පුහුණුව ද්විත්ව ක්‍රමය මත සැලසුම් කර ඇත. 1.1 සිට 1.4 දක්වා වෘත්තීය පුහුණුවේ පළමු වසරේ මූලික පුහුණුව ආයතනය තුලදී ලබා දේ. පුහුණුවේ දෙවන හා තුන්වන වසර වැඩිදුර පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන ප්‍රධාන කර්මාන්ත ශාලා වලට අනුයුක්ත කරනු ලැබේ.

4.2 1.5 සිට 1.6 දක්වා වෘත්තීන් සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුලදී මූලික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර උක්ත 4.1 ආකාරයෙන් කර්මාන්ත ශාලාවල පුහුණුව ලබාදේ.

4.3 උක්ත සියලුම වෘත්තීන් සඳහා දේශිය හා විදේශිය රැකියා අවස්ථාවන් වර්ධනය වී ඇත. විශේෂයෙන්ම 1.5 හා 1.6 වෘත්තීන් දෙක සඳහා දේශීය හා විදේශිය රැකියා සඳහා ඉල්ලුම වැඩිවී ඇත.

4.4 යන්ත්‍ර ශිල්පී වෘත්තිය සඳහා මූලික යන්ත්‍ර පුහුණුවට අමතරව හෙඩ් පේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් සහ කටර් ග්‍රයින්ඩින් යන සියළුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ය.

4.5 සියළුම පාඨමාලා “ජාතික වෘත්තීය සුදුසුකම” (NVQ) ඉලක්ක කර ගත් නිපුනතා පාදක පුහුණු ක්‍රමය (CBT) මත පවත්වා ගෙන යනු ලැබේ.

5. දීමනා හා වෙනත් ප්‍රතිලාභ :-

* ආයතනයේ පුහුණුවන කාලය තුලදී මාසික ආධුනිකත්ව දීමනාවක් හා පුහුණුව සඳහා මසා නිමකළ නිල ඇඳුමක් (Overall) ද ලබා දෙනු ලැබේ.

* සීමිත සිසුන් සංඛ්‍යාවකට ශිෂ්‍යාධාර ලබාදීමේ ක්‍රමයක් ද පිහිටුවා ඇත.

* පුහුණුවට බඳවා ගන්නා සියළුම ආධුනිකයින්ට ඉංග්‍රීසි භාෂාව හා පරිඝනක දැනුම ලබා දෙනු ලැබේ.

6. ආධුනිකත්ව ගිවිසුම:-

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයකු විසින්ම ආධුනිකයා සහ සේවා යෝජකයා යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුලත් විය යුතුයි.

6.2 පාඨමාලාවෙහි මුල් මාස 06 ආධුනිකයාගේ පරිවාස කාලය ලෙස සැලකේ අනෙකුත් විනය නීති අනුව සතුටුදායක ලෙස පරිවාස කාලය අවසන් කිරීමට අපොහොසත් වුවහොත් එම ආධුනිකයින්ගේ ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

7. සහතික ලබා දීම

7.1 සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන ආධුනිකයින්ට "4 වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය" ප්‍රදානය කරනු ලැබේ. මෙම සහතිකය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති අතර, ජාත්‍යන්තරව පිළිගන්නා සහතිකයකි.

8. තෝරා ගැනීම

8.1 මූලික සුදුසුකම් සපුරන සියළුම අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ලබා ගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය මත බඳවා ගනු ලැබේ.

9. අයදුම්පත් එවිය යුතු ආකාරය

9.1 අයදුම්පත් පහත දක්වා ඇති ආකෘතිය අනුව 11 1/2" x 8 1/4" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2008 අගෝස්තු මස 31 දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

අධ්‍යක්ෂ/විදුහල්පති,<br>
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය,<br>
නො. 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,<br>
ඔරුගොඩවත්ත,<br>
වැල්ලම්පිටිය.

9.2 එක් අයදුම්කරුවෙකුට තමාගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය අනුව වෘත්තීන් තුනක් ඉල්ලුම් කල හැකිය. එය පැහැදිලිව අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කළ යුතුය.

9.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පුහුණුවක් දැනට ලබමින් සිටින අයට මේ සඳහා අයදුම් කළ නොහැක.

9.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2009" යනුවෙන් සඳහන් කළ යුතුයි.

9.5 තැපෑලේදී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,<br>
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය,<br>
අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>
වැලිකඩ,<br>
රාජගිරිය.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම් පත්‍රය - 2009 වර්ෂය සඳහා**

මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

01. මුලකුරු සමග නම:-

| 03. | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| | | |

02. සම්පූර්ණ නම:-

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය:-

06. ලිපිනය:-<br>
දුරකථන අංකය:-

07. පරිපාලන දිස්ත්‍රික්කය:<br>
ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසය:-

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උසස්ම සුදුසුකම් **X** ලකුණින්)

| 8 වන ශ්‍රේණිය | අ. පො. ස. (සා. පෙ.) |
|---|---|

09. අ. පො. ස (සා. පෙ.) විභාගයේ ප්‍රතිඵල:<br>
*සමත්වූ විෂයයන් ශ්‍රේණිය වර්ෂය සමත්වූ විෂයයන් ශ්‍රේණිය වර්ෂය*

| | |
|---|---|
| 1. | 2. |
| 3. | 4. |
| 5. | 6. |
| 7. | 8. |
| 9. | 10. |
| 11. | 12. |

අ. පො. ස. (උ. පෙ.) විභාගයේ ප්‍රතිඵල

| | |
|---|---|
| 1. | 3. |
| 2. | 4. |

10. තමා පුහුණුව ලැබීමට කැමති වෘත්තීන් අනුපිළිවෙලින් :

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත්, මම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය යටතේ පුහුණුවක් දැනට නොලබන බවත්, මෙයින් සහතික කරමි. ඉහත සඳහන් කරුණු අසත්‍ය බව අනාවරණය වුවහොත් මම ආධුනිකත්ව පුහුණුව ලැබීමට නුසුදුස්සකු වන බව ද හොඳින් දනිමි.

දිනය :———.

———,<br>
අයදුම්කරුගේ අත්සන.

සභාපති,<br>
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය<br>
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>
වැලිකඩ, රාජගිරිය.

08-352

## ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය

### ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2008 වර්ෂය

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මගින් සිංහල භාෂාවෙන් පවත්වනු ලබන ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා වයස අවුරුදු 18-35 අතර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සටහන :- 01. දැනට රජයේ සේවයේ නියුක්තව සිටින්නන්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.

2. මෙම පාඨමාලාව සඳහා අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී නියමිත පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් අවලංගු කිරීමට සිදුවේ.

2. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

2.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී හෝ ඊට සමාන පරීක්ෂණයකදී ශාස්ත්‍රීය විෂයයන් හයකින් දෙවතාවකට නොවැඩි පෙනී සිටීමකින් සාමාර්ථය සහ එම විෂයයන් හයෙන් දෙකක් සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය හෝ අංක ගණිතය විය යුතුය.

2.2 තවද, ඔහු හෝ ඇය,

(අ) පිළිගත් ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපන පිළිබඳ පාසැලක යටත් පිරිසෙයින් හය මාසයක පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ආ) යුද්ධ, නාවික හෝ ගුවන් හමුදා පුහුණු කිරීමේ පාසැලක ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

හෝ

(ඇ) පාසැල් ක්‍රීඩා ගුරුවරයෙකු හෝ ගුරුවරියක වශයෙන් හෝ පළාත් පාලන ආයතනයක ක්‍රීඩා භූමි උපදේශක වරයෙකු හෝ උපදේශකවරියක වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු පහක පළපුරුද්දක් සහිතව ක්‍රීඩා ක්ෂේත්‍රයෙහි විශේෂ දක්ෂකම් දක්වා තිබීම ;

හෝ

(ඈ) කිසියම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා කණ්ඩායමක සාමාජිකයෙකු වශයෙන් කිසියම් අන්තර් ජාතික ක්‍රීඩා තරගයකට සහභාගී වී තිබීම;

හෝ

(ඉ) ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික ක්‍රීඩා උළෙලේ දිස්ත්‍රික් මට්ටමේ තරගයකදී ප්‍රථම හෝ දෙවන ස්ථානය ලබා තිබීම. එසේ නැතහොත් ජාතික ක්‍රීඩා සංගමයක් මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ තරගයකදී පළමුවන, දෙවන හෝ තුන්වන ස්ථානය ලබා තිබීම.

3. අයදුම්පත් එවීමේ ක්‍රමය :

3.1 ඉහත සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් විසින් මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය පරිදි 8"X13 1/2" ප්‍රමාණයේ කඩදාසියක සකස් කරගත් අයදුම්පත් තම අත් අකුරින් සම්පූර්ණ කර 2008.09.12 වන දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ,ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, අංක 100/7, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

3.2 අයදුම්පත බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ "2008 ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව" සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

3.3 රජයේ, පළාත් පාලන සේවයේ, සංස්ථා සේවයේ නියුතු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්, අදාල දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

4. තෝරා ගැනීම :

මෙම පාඨමාලාව සඳහා ලැබෙන අයදුම්පත් අතුරින් සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියළු දෙනා ලිඛිත පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, බඳවා ගැනීමේ මණ්ඩලයක් විසින් නිශ්චය කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකට හා ශාරීරික යෝග්‍යතා ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවීමෙන් පසුව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

5. පාඨමාලාව පිළිබඳ විස්තර :

5.1 විෂය නිර්දේශය පහත සඳහන් පරිදි කොටස් 05කින් යුක්තය.

(අ) පුහුණු වීමේ සාමාන්‍ය සිද්ධාන්ත (ශාරීරික ගුණාංග හා හැකියාවන්, තාක්ෂණ ක්‍රම, උපාය මාර්ග, පුහුණු වීමේ ක්‍රම, සැලසුම් ක්‍රම, භාරය හා පරීක්ෂණ පිළිබඳ මූලධර්ම ආදී වශයෙනි.);

(ආ) අවම වශයෙන් ක්‍රීඩා 10ක් පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික දැනුම;

(ඇ) ජවන හා පිටිය මලල ක්‍රීඩා පිළිබඳ විශේෂඥතාවය;

(ඈ) ජවන හා පිටිය මලල ක්‍රීඩා වලට අමතරව ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලා කාලය තුළ ගැහැණු අය හෝ පිරිමි අය සඳහා අවස්ථාවෝචිත පරිදි තෝරා ගන්නා ලද එක් ක්‍රීඩාවක් පිළිබඳ විශේෂඥතාවය;

(ඉ) ක්‍රීඩා ශාරීරික විද්‍යාව හා සමාජ විද්‍යාව, ක්‍රීඩා පරිපාලනය, ක්‍රීඩා උත්සව සංවිධාන ක්‍රම සහ ක්‍රීඩා මනෝ විද්‍යාව වැනි පොදු විෂයයන් අධ්‍යයනය කිරීම.

5.2 . පාඨමාලාවේ කාලසීමාව මාස 12කි.

5.3. මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන, රැකියා විරහිත අයදුම්කරුවන් විසින් රු. 6,000ක මුදලක් ද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හෝ පළාත් සභාවල රැකියාවන්හි නිරත අයදුම්කරුවන් විසින් පෞද්ගලිකව හෝ ආයතනය මගින් රු. 10,000ක මුදලක් ද, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මෙම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

5.4 පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන අය, ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ නීති හා රෙගුලාසි පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

5.5 පාඨමාලාව සාර්ථකව නිම කරන අය සඳහා ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමා සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

6. අනෙකුත් කොන්දේසි :-

6.1 පාඨමාලාව අවසානයේදී රැකියාවක් ලබාදීමට මෙම අමාත්‍යාංශය බැඳී නැත.

6.2 එතෙකුදු වුවත්, පාඨමාලාව හදාරන්නන් විසින් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ සමග ගිවිසුමකට එළඹිය යුතු යැයි මෙම අමාත්‍යාංශය අදහස් කරන්නේ නම්, එම ගිවිසුමට එළඹීමට පාඨමාලාව හදාරන්නන් බැඳී සිටිය යුතුය.

6.3 මෙහි ආවරණය නොවන අනිකුත් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්‍ෂ, සිය අභිමතය පරිදි කටයුතු කරනු ඇත.

එස්. ලියනගම,
ලේකම්,

ක්‍රීඩා හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය,
අංක 7ඒ, රීඩ් මාවත,
කොළඹ 07.

2008 ජූලි මස 21 වැනි දින,

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ක්‍රීඩා ඩිප්ලෝමා පාඨමාලාව - 2008 වර්ෂය***

*ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය*

01. (i) සම්පූර්ණ නම:——————. මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම:——————.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

(iv) ජාතික හැඳුනුම්පත් අංකය:——————.

02. ලිපිනය (i) පෞද්ගලික:——————.
(ii) කාර්යාලීය:——————.

03. (i)උපන්දිනයඃ-වර්ෂයඃ [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(ii) 2008.09.12 දිනට වයස ඃ වර්ෂ [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

04. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද ? නැති ද? යන වග :——————.
පුරවැසියෙක් නම් ලියාපදිංචි වීමෙන් ද? පරම්පරාවෙන් ද? යන වග :——————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
(ii) විවාහක/අවිවාහක බව:——————.

06. ඔබ රැකියාවක් කරයි ද? /නොකරයි ද? යන වග ඃ
(i) දැනට දරන තනතුර:——————.
(ii) රැකියාවේ සේවා කාලය:——————.

07. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් ඃ

| *වර්ෂය* | *විභාගය* | *විෂයයන්* | *ලබා ඇති සාමාර්ථයන්* |
|---|---|---|---|
| | | | |

08. ක්‍රීඩා දක්‍ෂතාවයන් (ලබා ඇති සහතික හා විශේෂ දස්කම් පිළිබඳ මෙහි සටහන් කරන්න.) :——————.

09. (i) ගැසට් නිවේදනය අනුව ඔබ මෙම පාඨමාලාවට සුදුසුකම් ලබන්නේ ඉහත 2.2 ඡේදයේ අ, ආ, ඇ, ඈ, ඉ දක්වා වන ඡේදවලින් කුමන ඡේදය යටතේ ද?:——————.
(ii) අදාල ඡේදය යටතේ ඔබ ලබා ඇති සුදුසුකම් විස්තර සහිතව සඳහන් කරන්න.:——————.

10. වෙනත් කරුණු ඃ——————.

11. මෙම පාඨමාලාවට තෝරාගනු ලැබුවහොත්, රු. 6,000ක හෝ රු. 10,000ක මුදලක්, පාඨමාලා ගාස්තු වශයෙන් ගෙවීමට ඔබ සූදානම් ද, යන වග :——————.

මෙහි ඉහත මා විසින් දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මම සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි හෝ බව යම්කිසි අයුරකින් සොයාගනු ලැබුවහොත් මෙම පාඨමාලාව හැදෑරීමට නුසුදුස්සකු වන බව හා පුහුණු පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන බව මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————.

රජයේ පළාත් පාලන සේවයේ හා සංස්ථා සේවයේ නියුක්ත වූවන් සඳහා පමණි.

අධ්‍යක්‍ෂ,
ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

මෙම .............................. සේවය කරන.......................................වන .....................................................මහතා/මහත්මිය/මෙනවියගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරන අතර, මෙම අයදුම්කරු ඉහත පාඨමාලාව සඳහා තෝරාගනු ලැබුවහොත් පාඨමාලා කාලය සඳහා ඔහුව/ඇයව සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කරමි.

——————.
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නිල මුද්‍රාව:——————.

දිනය:——————.

නම:——————.

තනතුර:——————.

08-396